# මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

மகாவலி ,கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சு

**Ministry of Mahaweli, Agriculture, Irrigation and Rural Development**

## ජාතික පොහොර ලේකම් කාර්යාලය

## தேசிய உரச் செயலகம்

## National Fertilizer Secretariat

නො. **288,** ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.

இல. 288, ஸ்ரீ ஜயவர்தனபுர மாவத்தை, ராஜகிரிய, இலங்கை.

No. **288,** Sri Jayawardenepura Mawatha, Rajagiriya, Sri Lanka.


| මගේ අංකය. / எனது இல. / My No. | 7/1/2/3/4/NFP | ඔබේ අංකය. / உமது இல. / Your No. | | දිනය. / திகதி. / Date. | 2020.03.26 |
|---|---|---|---|---|---|

**විශේෂ දැනුම් දීමයි !**

සියළුම බලපත්‍රලාභී පොහොර සමාගම් වෙත,

***<u>කොරෝනා වසංගත තත්ත්වය යටතේ පොහොර විධිමත්ව බෙදාහැරීම</u>***

පොහොර, ආහාර නිෂ්පාදනය සහ ආහාර සුරක්ෂිතතාවය සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවින් පොහොර නිෂ්පාදනය හා ගොවීන් වෙත ආරක්ෂිතව බෙදා හැරීම "Covid 19" වසංගත තත්ත්වය යටතේ සිදු කළ යුතු අත්‍යාවශ්‍ය කාරණයක් ලෙස රජය මඟින් ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අනුව, පොහොර නිෂ්පාදනය කරන සමාගම් හා බෙදා හරින සමාගම් ඊට අදාළ කාර්යයන් සියල්ලම සීමිත කාර්ය මණ්ඩලයක් යොදවා ගෙන, සේවකයන් අතර "Covid 19" වසංගත තත්ත්වය ප්‍රචාරණය නොවීම සඳහා අවශ්‍ය සියළු සෞඛ්‍ය ආරක්ෂණ පහසුකම් යටතේ කාර්යයන් පවත්වා ගෙන යා යුතු වේ. පොහොර අපනයනය, රේගු නිෂ්කාෂණයන් හා වෙළඳ අනුමැතීන් ඉල්ලුම් කරන අවස්ථාවේ දී විද්‍යුත් තැපැල මඟින් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

තවද, පොහොර බෙදාහැරීම සඳහා ප්‍රාදේශීයව ඔබ සමාගම යටතේ ලියාපදිංචි වී ඇති නියෝජිතවරුන් ගේ වෙළඳ ස්ථාන ගොවීන්ට පොහොර මිල දී ගැනීමට හැකිවන පරිදි විවෘත කර තබා ගැනීමට ඔබ විසින් දැනුම් දිය යුතුය. එමෙන්ම, මේ සමඟ විද්‍යුත් තැපැලෙන් එවනු ලබන දැන්වීම එම පොහොර වෙළඳසැල් වල අලවා තැබීමට උපදෙස් දිය යුතුය.

එමෙන්ම, පොහොර ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රධාන වෙළඳ පොළට එළවළු ප්‍රවාහනය කරන ලොරි රථ යොදා ගැනීමට හැකි අතර ඔබ සමාගමේ හෝ නියෝජිතයන් ගේ ලොරි රථ හැරුණු විට වෙනත් ලොරි රථ ඒ සඳහා යොදා ගන්නේ නම්, ඒ සඳහා සුදුසු අවසරය ලබා දීමට ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් වෙත මෙමඟින් බලය පවරනු ලැබේ. මෙම ලිපිය සමඟ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්ගේ දුරකථන නාමාවලිය ඔබ වෙත විද්‍යුත් තැපැලෙන් එවන අතර මෙම ලිපිය <u>www.aginfo.lk</u> වෙබ් අඩවියට උඩුගත (Upload) කර ඇති බව කාරුණිකව දන්වමි.

මහේෂ් ගම්මම්පිල
අධ්‍යක්ෂ
ජාතික පොහොර ලේකම් කාර්යාලය

පිටපත් සඳහා කරුණාකර අනෙක් පිට බලන්න


| | | |
|---|---|---|
| ලේකම් / செயலாளர் / Secretary | දුරකථන தொலைபேசி Telephone | 011-2879048 |
| | ඊ-මේල් மின்னஞ்சல் e- mail | secretary@agrimin.gov.lk |
| | ෆැක්ස් தொலைநகல் Fax | 011-2863497 |
| කාර්යාලය / அலுவலகம் / Office | දුරකථන தொலைபேசி Telephone | 011-2872093, 011-2872097 |
| | ඊ-මේල් மின்னஞ்சல் e- mail | info@agrimin.gov.lk |
| | ෆැක්ස් தொலைநகல் Fax | 011-2868910 |

පිටපත් :

1. ලේකම්, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - එම
3. පොලිස්පති , ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව - එම
4. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් - එම
5. කම්කරු කොමසාරිස් ජනරාල් - එම
6. සියළුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් - එම
7. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ සියළුම සහකාර අධ්‍යක්ෂවරුන් - අදාළ පරිදි කටයුතු කිරීමට